කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.06.06 දිනැති සහ අංක 3208 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මහවඩුගේ ශර්ලින් ජෝසප් පෙරේරා යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හත්ලක්ෂ දහතුන්දහස් හතලිස්හයයි ශත අනූදෙකක (රු. 7,13,046.92) මුදලක් 2010.04.19 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 7,13,046.92ක මුදලට 2010.04.20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 3208 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, පානදුර තල්පිටි දෙබැද්දේ බණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාවට අයත් (තල්පිටි දෙබැද්දේ උප කාර්යාලය) කුඩා අරුක්ගොඩ ගමෙහි පිහිටි "ජම්බුගහවත්ත සුදන්ගේපිටියවත්ත සහ ඕවිට (දැන් මෙල්ෆෝඩ් එස්ටේ)" නමැති ඉඩමෙන් බෙදා වෙන්කළ ලොට් 10 නමැති ඉඩමට බලයලත් මානක ජේ. ආර්. අලකෝන් විසින් මැන සාදන ලද අංක 1521 සහ 2006 ජූලි මස 01 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 9 (කාණුව සඳහා වෙන් කර ඇති කොටස) සහ ලොට් 8ත් ද, (අඩි 15ක් පළලැති පාර), නැගෙනහිරට : ලොට් 7ත් ද (අඩි 16ක් පළලැති පාර), දකුණට : ලොට් 11ත් ද, සහ මියගිය රොමානිස් පෙරේරාට උරුමකරුවන් විසින් හිමිකම් කියන පැලපොල්කොටුවෙන් ද සහ බස්නාහිරට : මියගිය රොමානිස් පෙරේරාගේ උරුමකරුවන් විසින් හිමිකම් කියන පැලපොල්කොටුවෙන් ද මායිම් වූ එකී අංක 1521 දරන පිඹුර ප්‍රකාරව පර්චස් එකොලහයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 11.5) ක් විශාල ඉඩම වේ.

තව ද අංක 3208 දරන බැඳුම්කරයෙහි උපලේඛනයේ වැඩිදුරටත් විස්තර වන මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

06-117/7

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - කෝට්ටේ ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

එදිරිසිංහ ආරච්චිගේ මහේන්ද්‍ර ලලිත් එදිරිසිංහ.

2010.03.31 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 1996.03.25 සහ 1997.05.12 සහ දිනැති පිළිවෙලින් අංක 304 සහ 550 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම එදිරිසිංහ ආරච්චිගේ මහේන්ද්‍ර ලලිත් එදිරිසිංහ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දහහත්ලක්ෂ අනූහයදහස් අනූදෙකයි ශත හතරක (රු. 17,96,092.04) මුදලක් 2010.03.12 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 17,96,092.04ක මුදලට 2010.03.13 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 304 සහ 550 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ නගර සභා සීමාවේ (දැන් කොටා පාර) දොස්තර එන්. එම්. පෙරේරා මාවතේ, වරිපනම් අංක 118/2හි "මැක්ස්වෙල් හවුස් " නමැති ඉඩමට බලයලත් මානක එන්. ඩී. සිරිසේන විසින් ලියා සහතික කරන ලද 1959.08.07 දිනැති අංක 127 පිඹුරේ ලොට් අංක 4 නමැති ඉඩමට මායිම්, උතුරට : ලොට් අංක 1න් ද, නැගෙනහිරට : ලොට් අංක 3න් ද, දකුණට : ලොට් අංක 5න් සහ බස්නාහිරට : කොටා පාරේ, වරිපනම් අංක 110/1 සිට 03න් ද මායිම් වූ පර්චස් විසිදෙකයි දශම බින්දුවයි හයක් (අ. 0, රූ. 0, පර්. 22.06) විශාල ඉඩම ගොඩනැගිලි සහ සියළු දේත් සමග වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ529/209 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක සී. එච්. ඩයස් විසින් මැන සාදන ලද 1996.03.07 දිනැති අංක 2110 ලෙස ඉහත ඉඩම නැවත මැනීමකට අනුව පහත පරිදි විස්තර වේ :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ නගර සභා සීමාවේ, වැලිකඩ, දොස්තර එන්. එම්. පෙරේරා මාවතේ (දැන් කොටා පාර) වරිපනම් අංක 118/2හි "මැක්ස්වෙල් හවුස් " නමැති ඉඩමේ ලොට් අංක 4ඒ නමැති ඉඩමට මායිම්, උතුරට : කොට පාරේ, වරිපනම් අංක 110/1-3 සහ පිඹුරු අංක 127හි ලොට් අංක 1 න් ද, නැගෙනහිරට : පුද්ගලික පාර (පිඹුරු අංක 127හි ලොට් අංක 3) න් ද, දකුණට : කොටා පාරේ, වරිපනම් අංක 110/1-3 සහ පිඹුරු අංක 127හි ලොට් අංක 1න් ද සහ බස්නාහිරට : කොටා පාරේ,

වරිපනම් අංක 110/1-3 න් ද මායිම් වූ පර්චස් විසිදෙකයි දශම බින්දුවයි හය (අ. 0, රූ. 0, පර්. 22.06)ක් විශාල ඉඩම ගොඩනැගිලි සහ වෙනත් සියළු දේත් සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

06-117/8

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - හෙට්ටිවීදිය ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

සී ඩී අයි ප්‍රොපටි ඇන්ඩ් මාර්කටිං සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2010.04.29 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ද සිල්වා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2006.08.25 දිනැති සහ අංක 1930 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සී ඩී අයි ප්‍රොපටි ඇන්ඩ් මාර්කටිං සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් තිසිහයලක්ෂ විසිහත්දහස් පන්සිය දෙකයි ශත අසූහය (රු. 36,27,502.86) ක මුදලක් 2010.01.25 වැනි දින වන විට හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 36,27,502.86ක මුදලට 2010.01.26 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1930 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභා සීමාවේ, වසම් අංක 42 (හැව්ලොක් ටවුන්) හි පිහිටි සෙකල්ටන් පාරේ, වරිපනම් අංක 7/2 දරන ඉඩම වන බලයලත් මානක එම්. එස්. ටී. පී. සේනාධීර විසින් පිළියෙල කරන ලද 1984.09.12 දිනැති අංක 1482 දරන පිඹුරෙන් බෙදා වෙන් කළ ලොට් 2ඒ නමැති ඉඩමේ කොටසට මායිම්, උතුරට : සෙකල්ටන් පාරේ වරිපනම් අංක 5 දරන පරිශ්‍රයෙන් ද, නැගෙනහිරට : හැව්ලොක් පාරේ, වරිපනම් අංක 220 සහ 224 දරන පරිශ්‍ර වලින් ද, දකුණට : සෙකල්ටන් පාරේ වරිපනම් අංක 7/4 දරන පරිශ්‍රයෙන් සහ පුද්ගලික පාරෙ (අඩි 10 පළල) න් ද සහ බටහිරට : අංක 1482 දරන පිඹුරේ ලොට් 2බී වලින් ද, මායිම් වූ එකී අංක 1482 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහහතරයි දශම පහයි අට (අ. 0, රූ. 0. පර්. 14.58) ක් විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළුදේත් සමග වන මෙම ඉඩම කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1027/145 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී අංක 1930 දරන බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

06-117/12

---

## හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී - මොරටුව ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

මල්ලිකා ආරච්චිගේ ජයසිංහ.

2010.04.29 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2008.11.26 දිනැති සහ අංක 4675 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මල්ලිකා ආරච්චිගේ ජයසිංහ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් විසිදෙලක්ෂ දාහත්දහස් එකසිය විසිපහයි ශත විසිඅට (රු. 22,17,125.28) ක මුදලක් 2010.03.26 වැනි දින වන විට හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 22,17,125.28ක මුදලට 2010.03.27 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 4675 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඊ. එස්. රමනායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළේ, කුඹුකේ පත්තුවේ, හොරණ ප්‍රාදේශීය සභාවෙහි කතන්විල උප කාර්යාල සීමාව තුළ තලගල පිහිටි "අට්ටාලේවත්ත හෙවත් මුරාගේ මහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක පී. කේ. සුමනදාස විසින් මැන සාදන ලද අංක 76/1760 සහ 2001 ජුනි මස 06 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් "22 සහ 23" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : බස් පාරෙන් ද, නැගෙනහිරට : ලොට් 24න් ද, දකුණට : ලොට් 16 සහ 21න් ද, බස්නාහිරට : ලොට් 19න් ද මායිම් වූ රූඩ් එකයි පර්චස් දහතුනයි දශම තුනයි එක (අ. 0, රූ. 1, පර්. 13.31) ක විශාල ඉඩම අංක 76/1760 දරන පිඹුර ප්‍රකාර වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

06-117/9

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - පානදුර ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

උඩුගම කෝරලලාගේ දොන් ප්‍රසන්න ප්‍රියශාන්ත උඩුගම සහ වඩුගේ රේණුකා ස්වර්ණා ප්‍රනාන්දු.

2010.03.31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2002.07.19, 2003.02.25, 2004.03.17, 2005.03.23 සහ 2007.10.18 දිනැති සහ පිළිවෙලින් අංක 151, 316, 796, 1252 සහ 2144 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම උඩුගම කෝරලලාගේ දොන් ප්‍රසන්න ප්‍රියශාන්ත උඩුගම සහ වඩුගේ රේණුකා ස්වර්ණා ප්‍රනාන්දු යන අයවළුන් ණයකරුවන් හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් විසිහයලක්ෂ පනස්හයදහස් හයසිය හතරයි ශත හැටදෙක (රු. 26,56,604.62) ක මුදලක් 2010.03.05 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 26,56,604.62ක මුදලට 2010.03.06 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 151, 316, 796, 1252 සහ 2144 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එස්. මනම්පේරි ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, මොරටුව නාගරික සීමාවේ, එගොඩ උයන, ආරියදාස ධර්මබන්දු මාවතේ, වරිපනම් අංක 79, පමුබුරුගහවත්ත, පබුරුගහවත්ත නොහොත් කම්බගහවත්ත, පම්බුරුගහවත්ත නොහොත් කම්බදන්ගහවත්ත සහ පබුරුගහවත්ත නොහොත් පෙයරුගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඒ. විල්ෆ්‍රු රොඩ්රිගු විසින් ලියා සහතික කරන ලද 1993.10.28 දිනැති අංක 1233 පිඹුරේ ලොට් අංක 2 නමැති ඉඩමට මායිම්, උතුරට : ආරියදාස ධර්මබන්දු මාවතෙන් ද, නැගෙනහිරට : දේවිනි සෙල්ලප්පෙරුමට අයිති ඉඩමෙන් ද, දකුණට : එල්. වයි සිල්වා අයිති ඉඩමෙන් ද, සහ බස්නාහිරට : ලොට් අංක 1 න් ද මායිම් වූ පර්චස් හයයි දශම බින්දුවයි අට (අ. 0, රූ. 0, පර්. 6.08)ක් විශාල ඉඩම සහ සියළු දේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

06-117/10

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - පිටකොටුව ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

අප්පයියා තවබාලචන්ද්‍රන්.

2010.03.31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. සී. පී. වෙත්තසිංහ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 1997.05.28 දිනැති සහ අංක 1009 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අප්පයියා තවබාලචන්ද්‍රන් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිලක්ෂ හතලිස්අටදහස් පනස්හයයි ශත හැත්තෑදෙකක (රු. 20,48,056.72) මුදලක් 2010.03.03 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 20,48,056.72ක මුදලට 2010.03.04 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1009 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ

ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභා සීමාව තුළ වසම් අංක 43, වැල්ලවත්ත උතුරෙහි පිහිටි ලිලී ඇවනියු, වරිපනම් අංක 42 දරන බලයලත් මානක පී. සින්නතම්බි විසින් 1993.06.19 දින පිළියෙල කරන ලද අංක 4048 දරන සභාධිපත්‍ය පිඹුරේ බිම් මහලේ ඒකක 1 දරන නේවාසික සභාධිපත්‍ය ඒකකයට මායිම් ඒකක 1 දරන උතුරට : මෙම ඒකකයෙහි මැද බිත්තියෙන් සහ සීඊ1 න් ද, නැගෙනහිරට : මෙම ඒකකයේ බිත්ති සමග ලිලී ඇවනියු, වරිපනම් අංක 40ට අයත් ලොට් 1399න් ද, දකුණට : මෙම ඒකකය සහ සීඊ 3 අතර ඇති බිත්තියේ මැදින් ද, බස්නාහිරට : මෙම ඒකකය සහ සීඊ4, සීඊ5(එස්ඩබ්) සීඊ2 අතර ඇති බිත්තියේ මැදින් සහ මෙම ඒකකයේ බිත්තිය සමග ලිලී ඇවනිව් හි වරිපනම් අංක 44 දරන ලොට් 1397න් ද පතුලෙන් බිම් මහලෙන්ම ද උඩින් ඒකක 2 දරන උඩින් ඇති කොන්ක්‍රීට් බිමේ මැදින් ද මායිම් වූ එකී සභාධිපත්‍ය පිඹුරු අංක 4048 ප්‍රකාරව වර්ග මීටර එකසිය දෙක (ව. මී. 102) ක් එනම් වර්ග අඩි එක්දහස් අනූඅටක (ව. අඩි 1098) බිම් ප්‍රමාණයක් වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සභාධිපත්‍ය එස්.පී/6/135 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

ඒ සමග අංක 4048 දරන සභාධිපත්‍ය පිඹුරේ නිරූපිත පරිදි සීඊ1, සීඊ2 සහ සීඊ3 දරන ඒකක තුළින් හදිසි පොදු කොටන් ප්‍රවේශ වේ. ඒ සමග අංක 1009 බැඳුම්කරයේ වැඩිදුරටත් විස්තර කර ඇති පරිදි පොදු කොටස් අගය 47.88%.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

06-117/11

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - වැල්ලවාය ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

රාජපක්ෂ මුදියන්සේලාගේ චන්දන තිලක් රාජපක්ෂ සහ රාජපක්ෂ මුදියන්සේලාගේ පුංචිබණ්ඩා රාජපක්ෂ.

2010.03.31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. ලියනගේ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2002.02.13 දිනැති සහ අංක 372 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රාජපක්ෂ මුදියන්සේලාගේ චන්දන තිලක් රාජපක්ෂ සහ රාජපක්ෂ මුදියන්සේලාගේ පුංචිබණ්ඩා රාජපක්ෂ යන අයවළුන් ණයකරුවන් හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් පන්ලක්ෂ පනස්දෙදහස් දෙසිය පහයි ශත තිස්නමය (රු. 5,52,205.39) ක මුදලක් 2009.08.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 5,52,205.39ක මුදලට 2009.09.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 372 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය කෝරළේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාවේ වේරහැර ජනපදයේ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වැල්ලවාය ප්‍රාදේශීය සභා සීමාවේ, වේහෙරයාය ජනපදයේ පිහිටි ඉඩමට සර්වේ ජනරාල් විසින් ලියා සහතික කරන ලද 1964 අප්‍රේල් සිට 1965 අප්‍රේල් දිනැති ටී. ඕ. පී. ඕ. පී. පී. 70 එම්. ඕ/94/4957 පිඹුරේ ලොට් අංක 632 ඉඩමට මායිම්, උතුරට : ලොට් අංක 629න් ද, නැගෙනහිරට : ලොට් අංක 578න් ද, දකුණට : ලොට් අංක 647 න් ද සහ බස්නාහිරට : ලොට් අංක 633න් ද, මායිම් වූ අක්කර තුනයි රූඩ් තුනයි පර්චස් තිස්හය (අ. 3, රූ. 3, පර්. 36)ක් විශාල ඉඩම වේ. එකී පිඹුරු අංක ටීඕපීඕ පීපී 70 එම්.ඕ/94/4957හි පෙන්වා ඇති මාර්ග අයිති ද සමග මෙම ඉඩම මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්ඩීඕ/එම්62/261 යටතේ ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

06-117/13

---

### පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - පංචිකාවත්ත ශාඛාව

1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගණුදෙනුකරුගේ නම : ඔටෝලයිට් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2010.04.27 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, ඔටෝ ලයිට් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම බන්ධනදායියා වශයෙන් ද (බන්ධනදායිගේ අධ්‍යක්ෂවරයෙකු වන) නල්ලපෙරුම ආරච්චිගේ ප්‍රියංග මනෝජ් කුමාර උගස්කරු වශයෙන් ද කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුන ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. අයි. සමරසිංහ විසින් සහතික කරන ලද වර්ෂ 2003ක් වූ මාර්තු මස 04 වන දිනැති අංක 1310 දරන උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 1310 දරන උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2010.03.22 දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් මිලියන හතරකුත් හය ලක්ෂ තිස් දෙදහස් නවසිය හැට හයයි ශත හැට හතක මුදලක් (රු. 4, 632, 966.67) ක මුදල සහ 2010.03.23 වන දින සිට රුපියල් මිලියන එකයි පන් ලක්ෂ හැත්තෑහත් දහස (රු. 1,577,000) ක මුදල මත වර්ෂයකට සියයට විසි එක (21%) බැගින් පොලිය ද පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්-

එකී අංක 1310 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් මිලියන හතරකුත් හය ලක්ෂ තිස් දෙදහස් නවසිය හැට හයයි ශත හැට හතක (රු. 4,632,966.67)ක මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද ගාස්තු ද අංක 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපල, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාරේ අංක 134හි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති වෙත එකී 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ මහ නගර සභා සීමාව ඇතුළත කොළඹ දිස්ත්‍රික්කයේ මරදාන, පංචිකාවත්ත පාරේ පිහිටි, බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු පී. සින්නතම්බි විසින් මැන සාදන ලද වර්ෂ 1997ක් වූ අප්‍රේල් මස 29 වන දිනැති අංක 5939 දරන සහාධිපත්‍ය පිඹුරේ නිරූපිත පංචිකාවත්ත පාරේ වරිපනම් අංක 196/7 දරන ඒකක 9 (සාප්පුව) බිම් මහල, එයට මායිම් : උතුරට මෙම ඒකකයේ සහ සීඊ 2 අතර බිත්තියේ මධ්‍යයෙන් ද නැගෙනහිරට මෙම ඒකකයේ සහ ඒකක 10හි අතර වූ බිත්තියේ මධ්‍යයෙන් ද දකුණට : පංචිකාවත්ත පාරේ වරිපණම් අංක 190 දරන පරිශ්‍රය සමඟ වන මෙම ඒකකයේ බිත්තියෙන් ද බස්නාහිරට මෙම ඒකකයේ සහ ඒකක 8 අතර බිත්තියේ මධ්‍යයෙන් ද පතුලින් බිම් මහලින් සහ මුදුනින් ඉහත ඒකක 23හි කොන්ක්‍රීට් පොළොවින් ද හතරැස් මීටර් දහයකුත් දශම නවයක් (10.9) හෙවත් වර්ග අඩි 117ක බිම් ප්‍රමාණය.

ඒකක 9 වෙළඳ සැලකි. මෙම ඒකකයට ආසන්නතම පොදු පෙදෙසට ඇති ප්‍රවේශය සීඊ 2 වේ.

සහාධිපත්‍ය දේපලෙහි පොදු අංගයන්හි මුලු කොටස් වටිනාකම 100%කි.

සහාධිපත්‍ය දේපළෙහි පොදු අංගයන්හි ඇතුළත් මෙම අංක 9 දරන ඒකකයෙහි නොබෙදූ කොටස් වටිනාකම 1.94%ක් වේ.

කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කොන්. ඒ 83/132 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ අණපරිදි,

සුදත් නැලිගම,
සහකාර කළමනාකරු - අයකරගැනීම්.

06-130/1

---

### ලංකා බැංකුව

#### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වෙනි වගන්තිය යටතේ දැන්වීම

2010.03.18 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :-

1. මහජන නොතාරිස් ඒ. සී. එස්. හමීඩ් විසින් සහතික කරන ලද 2002.03.25 දිනැති අංක 1050 සහ 2005.09.07 දිනැති අංක 1458 දරන බැඳුම්කර මත මුල් මුදල හා 2009.12.21 දින තෙක් පොලිය වශයෙන් රුපියල් හත්ලක්ෂ අසූ එක් දහස් හයසිය විසිදෙකයි ශත පනහක (රු. 7,81,622.50) මුදලක් සමඟ රුපියල් හයලක්ෂයක (රු. 6,00,000) මුදලක් මත වසරකට සියයට පහළොව (15%) බැගින් පොලියක් ද, 2009.12.22 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් එප්පාවල, කැකිරාව පාර, මුතුකුඩ පේපර් කෝනර් හි පදිංචි මුතුකුඩ වලව්වේ ශ්‍රීවංශ බණ්ඩාර දිසානායක මහතා සහ කටියාව, යාය 9, අංක 1හි පදිංචි මුතුකුඩ වලව්වේ අනුලා කුමාරිහාමි මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 1050, 1458 දරන බැඳුම්කර මත අයවිය යුතු එකී රුපියල් හත්ලක්ෂ අසූ එක් දහස් හයසිය විසිදෙකයි ශත පනහක (රු. 7,81,622.50) මුදල සමඟ 2009.12.22 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උගස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි වෙන්දේසිකාර ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි තුසිත කරුණාරත්න මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු, ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පල කිරීමට ලංකා බැංකුව, එප්පාවල ශාඛාවේ කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම්පළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ වර්තමානයේ නුවරගම් පළාත දකුණෙහි, එප්පාවල කෝරලේ, අංක 9A දරන ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාසයේ කටියාව යාය 9 ග්‍රාමයෙහි පිහිටි, සර්වේයර් ජනරාල් විසින් සාදන ලද හා ඔහු භාරයේ ඇති එල්. එස්. පී. පී. 38හි ලොට් අංක 653 ලෙස දක්වා ඇති කටියාව මූකලාන නමැති සීමා නිර්ණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 654 ද, නැගෙනහිරට : ලොට් 655 ද, දකුණට : ලොට් 652

ද, බස්නාහිරට ලොට් 673 ද මායිම්ව අක්කර දෙකයි, රූඩ් තුනයි, පර්චස් තිස්හතරක (අ. 2, රූ. 3, පර්. 34) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, එහි ඇති ගහකොළ ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ. මෙය අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. 603/08 හි ලියාපදිංචි කර ඇත.

මෑත දී සාදන ලද අංක 334 දරන පිඹුර ප්‍රකාර එකී ඉඩම පහත ආකාරයට විස්තර කර ඇත :

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එප්පාවල කෝරළයේ, කටියාව පිහිටි, කටියාව මූකලාන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පොත් තංගවඩිවේල් විසින් සාදන ලද 1998.09.05 දිනැති අංක 334 දරන පිඹුරේ ලොට් 1 ලෙස දක්වා ඇති ඉඩම් කැබැල්ල එකී අංක 334 දරන පිඹුරට අනුව උතුරට : එච්. ඒ. අගෝනෝනාගේ ඉඩම ද, නැගෙනහිරට : එච්. ආර්. හේරත් ගේ ඉඩම ද, දකුණට : චන්ද්‍රා හපුආරච්චිගේ ඉඩම ද, බස්නාහිරට : එප්පාවල සිට හල්මිල්ලෑව දක්වා පාර ද, මායිම් ව අක්කර දෙකයි රූඩ් තුනයි, පර්චස් තිස්හතරක (අ. 2, රූ. 3, පර්. 34) නොහොත් හෙක්ටයාර් එකයි දශම එකයි නවයයි නවයක (හෙක්ටයාර 1.199) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර, එහි ඇති ගහකොළ, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එම්. ජී. ආර්. විජේවර්ධන,
කළමනාකරු.

ලංකා බැංකුව,
එප්පාවල.

06-72

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. ඩබ්ලිව්. රාජකරුණා මහතා විසින් ලියා සහතික කරන ලද අංක 21999 සහ 2004.09.06 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර ඇත්තා වූ ද, ලියාපදිංචි කාර්යාලය කොළඹ පිහිටා ඇත්තා වූ ද සමාගමක් වන (මෙහි මින් මතු සමාගම යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ) ටෙක් වෝටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන සමාගම විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2007 ඔක්තෝබර් 31 වැනි දිනට ඉහත කී අංක 21999 දරන උකස් බැඳුම්කරය මත එකී ටෙක් වෝටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් තිස්හය ලක්ෂ හතළිස් අටදහස් හයසිය පනස් හතකුත් ශත පනස් හතරක (රු. 36,48,657.54) මුදලක් සහ 2007 නොවැම්බර් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තිස් තුන් ලක්ෂ පණස් එක් දහස් හයසිය හතළිස් තුනකුත් ශත පනස් නවයක් (රු.33,51,643.59) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතකුත් දශම පහක් (7.5%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන අනුපාතිකයක් මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රෙෂ්ඨාධිකරණය විසින් මෑතක දී එළඹෙන ලද නඩු තීන්දුව අනුව මෙම යෝජනා සම්මත කිරීමට ඩීඑෆ්සීසී බැංකුවට බලය ඇති හෙයින් ද, ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් තිස් හය ලක්ෂ හතළිස් අටදහස් හයසිය පණස් හතකුත් ශත පණස් හතරක (රු.36,48,657.54) මුදල සහ 2007 නොවැම්බර් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තිස් තුන් ලක්ෂ පනස් එක් දහස් හයසිය හතළිස් තුනකුත් ශත පණස් නවයක් (රු.33,51,643.59) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහබැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතකුත් දශම පහක් (7.5%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන අනුපාතිකයක් මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති වලට අනුකූලව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 21999 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ. කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 21999 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමා බල ප්‍රදේශය ඇතුළත වෝඩ් අංක 44, කිරුළපන පිහිටි, දෙල්ගහවත්ත නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු එච්. එච්. සුබසිංහ විසින් මැන සාදන ලද අංක 1819 හා 2001.08.18 දින දරන පිඹුරේ ලොට් අංක 7569 දරන බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : ලොට් අංක 7570 හා 7568 ද, නැගෙනහිරට : ලොට් අංක 7568 සහ ලොට් "ඒකේ" රේල්වේ ඇවනිව් වරිපනම් අංක 44 සහ හයිලෙවල් පාර වරිපනම් අංක 303 දරන පරිශ්‍ර ද, දකුණට : ලොට් "ඒකේ" රේල්වේ ඇවනිව් වරිපනම් අංක 44 සහ හයිලෙවල් පාර වරිපනම් අංක 303 දරන පරිශ්‍රය ද, බස්නාහිරට : හයිලෙවල් පාර සහ ලොට් අංක 7570 ද යන මායිම් ඇතුළත පර්චස් එකොළහකුත් දශම හතයි තුනක් (අ. 0, රූ. 0, පර්. 11.73) නොහොත් හෙක්ටයාර 0.02967 ක් විශාලත්වය ඇති ඉඩම.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

06-112

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

සිටි ෆාමසි හි ණය වගකීම් සඳහා උකස් කරන ලද දේපළ.

2009.06.25 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරන ලදී :

1. මහජන නොතාරිස් එස්. ආර්. ද සිල්වා විසින් සහතික කරන ලද 1996.09.04 දිනැති අංක 1460 දරන බැඳුම්කරය, මහජන නොතාරිස් ජී. ද අල්විස් මහතා විසින් සහතික කරන ලද 1999.06.29 දිනැති අංක 780 දරන බැඳුම්කරය, මහජන නොතාරිස් ජී. ද අල්විස් විසින් සහතික කරන ලද 2002.12.02 දිනැති අංක 1542 දරන බැඳුම්කරය, මහජන නොතාරිස් දීප්ති වීරසූරිය විසින් සහතික කරන ලද 2004.08.10 දිනැති අංක 103 දරන බැඳුම්කරය හා මහජන නොතාරිස් ඊ. කේ. එච්. එම්. කරුණාතිලක විසින් සහතික කරන ලද 2007.05.25 දිනැති අංක 477 දරන බැඳුම්කරය මත ප්‍රතිලේඛනගත කරන ලද ණය A සහ B මත මුල් මුදල හා 2009.05.31 දින තෙක් පොළිය වශයෙන් රුපියල් එක්කෝටි පනස්හත් ලක්ෂ අනූඑක් දහස් හයසිය හැත්තෑහයයි ශත හතලිස් හතරක (රු.1,57,91,676.44) මුදලක් සමග රුපියල් එක්කෝටි නවලක්ෂයක (රු.1,09,00,000) මුදලක් මත වසරකට සියයට විසි අටයි දශම පහ (28.5%) බැගින් පොළියක් සහ රුපියල් දහඅටලක්ෂයක (රු.18,00,000) මුදලක් සඳහා වසරකට සියයට දහයයි දශම බිංදුවක (10.0%) පොළියක් ද, 2009.06.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනට තෙක් මොරටුව, රාවතාවත්ත, ගාලු පාර, අංක 319 හි පිහිටි සිටි ෆාමසි වෙතින් අයවිය යුතුව ඇත.

2. එකී අංක 1460, 780, 1542, 103 සහ 477 දරන බැඳුම්කරයන් මත අයවිය යුතු එකී රුපියල් එක්කෝටි පනස් හත්ලක්ෂ අනූඑක් දහස් හයසිය හැත්තෑහයයි ශත හතලිස් හතරක (රු.1,57,91,676.44) මුදල සමග 2009.06.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව විහාර මාවත, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් වෙන්දේසිකාර මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, අයකරගැනීමේ ඒකකයේ, සම්බන්ධතා කළමනාකරුට ද (අයකරගැනීම් - ආයතනික) මෙයින් අවසරදී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේපත්තුවේ, මොරටුව නගර සභා සීමාවේ රාවතාවත්ත පිහිටි, කෙළින් වීදියේ, වරිපනම් අංක 650 1/1 සහ 650 2/1 දරන මාදන්ගහවත්ත සහ පඳිරියගහවත්ත නමැති ඉඩමට එහි ඇති ගහකොළ වැවිලි ගොඩනැගිලි සහ වෙනත් සියලුදේ ද ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. එල්. ද සිල්වා විසින් සාදන ලද 1961 අගෝස්තු 05 දිනැති අංක 3784 දරන පිඹුරෙහි ලොට් D ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් D, උතුරට : ලොට් E (පාරට වෙන්කළ කොටස)ද, නැගෙනහිරට : කොළඹ සිට ගාල්ල දක්වාවූ ප්‍රධාන පාර ද, දකුණට : වේල්ස් කුමාර විදුහල් වත්ත ද, බස්නාහිරට : ලොට් B ද, මායිම්ව එකී අංක 3784 දරන පිඹුර ප්‍රකාර පර්චස් නවයක (අ. 0, රූ. 0, පර්. 9) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර, මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2372/244 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ඩී. සිල්වා,<br>
සම්බන්ධතා කළමනාකරු,<br>
(අයකර ගැනීම් - ආයතනික).

ලංකා බැංකුව,<br>
අයකරගැනීමේ ඒකකය.<br>
අංක 04, ලංකා බැංකු මාවත,<br>
කොළඹ 01.

යෝජනාව සම්මත කර ගැනීමෙන් පසු ණය ගැණුම්කරු විසින් තැන්පත් කරන ලද රු. 50,000ක් අවිනිශ්චිත ගිණුම-ණය හිමියෝහි පවතින අතර එය ලැබිය යුතු මුල් මුදලෙන් අඩු කරනු ලැබේ.

06-75

---

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

ණය ගැණුම්කරුගේ නම : සී/ස ශ්‍රීයාන් ටීස් (පුද්ගලික) සමාගම<br>
අධ්‍යක්ෂවරුන්ගේ නම් : එස්. ඒ. ඒ. එස්. එල්. පෙරේරා මහතා/ඩී. ඊ. මුසාෆර් මහත්මිය/ඒ. එච්. මුසාෆර් මහතා,<br>
ලිපිනය : අංක 132E, එඬේරමුල්ල, වත්තල.

2010.03.18 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් එස්. එච්. රණවක විසින් සහතික කරන ලද 2008.05.21 දිනැති අංක 2339 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2010.02.01 දින තෙක් පොළිය වශයෙන් රුපියල් අනූදෙලක්ෂ හතලිස් දහස් හතයි ශත අනූඑකක (රු. 92,40,007.91) මුදලක් සමග රුපියල් අසූඅටලක්ෂ හැටපන්දහස් අටසිය හැටයි ශත හතලිස් නවයක (රු. 88,65,860.49) මුදලක් මත වසරකට සියයට පහළොව (15%) බැගින් පොළියක් ද, 2010.02.02 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් වත්තල, එඬේරමුල්ල, 132E, සීමාසහිත ශ්‍රීයාන් ටීස් (පුද්ගලික) සමාගමෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 2339 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් අනූදෙලක්ෂ හතලිස් දහස් හතයි ශත අනූඑකක (රු. 92,40,007.91) මුදල සමග 2010.02.02 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතුව පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි වෙන්දේසිකාර T& H ඔක්ෂන්ස් මහත්වරුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකුව ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම් පළ කිරීමට ලංකා බැංකුව, අගනුවර ශාඛාවේ, අයකර ගැනීම් හා ණය සුපරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කළමනාකාරිණියට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, නගර සභාව තුළ හැව්ලොක් ටවුන්හි අංක 42, කොට්ඨාසයෙහි පිහිටි ශාන්ත පීතර පෙදෙසෙහි වර්තමානයේ වරිපනම් අංක 37ඒ දරන ගොඩනැගිල්ල සහිත ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එෆ්. සමීර් විසින් සාදන ලද 1984 ජූලි මස 05 වැනි දිනැති අංක 3076 දරන පිඹුරෙහි ලොට් බී1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් බී1, උතුරට : ශාන්ත පීතර පෙදෙස ද, නැගෙනහිරට : ලොට් බී2 ද, දකුණට : කිරුළපනේ ඇල ද, බස්නාහිරට : ශාන්ත පීතර පෙදෙසෙහි වරිපනම් අංක 41 දරන ලොට් A ද, මායිම්ව එකී අංක 3076 දරන පිඹුර ප්‍රකාර පර්චස් හතයි දශම එකයි එකක (අ. 0, රූ. 0, පර්. 7.11) බිම් ප්‍රමාණයකින් යුක්තව එහි ඇති සියලු දේද වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ532/269 හි ලියාපදිංචි කර ඇත.

අයි. එම්. පණ්ඩිරත්න මිය.,
කළමනාකාරිණී,
අයකර ගැනීම් හා ණය සුපරීක්ෂණ.

ලංකා බැංකුව,
අගනුවර ශාඛාව,
අයකර ගැනීම් හා ණය සුපරීක්ෂණ දෙපාර්තමේන්තුව,
යොර්ක් වීදිය.

06-71

---

### මහජන බැංකුව - මාවනැල්ල ශාඛාව

### 1986 වර්ෂයේ අංක 32 දරන පනතේ සංශෝධිත 1961 වර්ෂයේ අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.10.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස් රොමෙල් විජේවර්ධන මහතා විසින් සහතික කරන ලද 2006.12.22 වැනි දිනැති අංක 10651 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම් උණගහපිටිය, මංගලගම, මොලගොඩ, කෑගල්ල යන ලිපිනයෙහි පදිංචි වීරසිංහ දේවගේ විමලාවතී යන අය සහ එම ලිපිනයෙහිම පදිංචි වැත්තෑවල කුමාරසිංහ යන අය විසින් ද කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එම්. සුසිල් හේරත් මහතා විසින් සහතික කරන ලද 2008.04.08 දිනැති අංක 569 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම ඉහත කී ලිපිනයෙහි පදිංචි වීරසිංහ දේවගේ විමලාවතී යන අයම සහ එම ලිපිනයෙහිම පදිංචි වැත්තෑවල කුමාරසිංහ යන එම අය විසින් ද පැහැර හැර ඇති බැවින්, එකී උකස්කර යටතේ පිළිවෙලින් රුපියල් එකොලොස් ලක්ෂ හතලිස් දහසක (රු. 11,40,000) මුදලක් සහ රුපියල් දොලොස් ලක්ෂ හතලිස් දෙදහස් නවසිය හතලිස් හතරක (රු. 12,42,944) මුදලක් හා පිළිවෙලින් 2009.01.27 වැනි දින සිට වර්ෂයකට සියයට විසිතුන (23%) සහ 2009.01.30 වැනි දින සිට වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ ඉහත කී මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකර ගනු ලැබිය හැකි මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී ණය මුදල් සඳහා රුපියල් එකොලොස් ලක්ෂ හතලිස් දහස (රු. 11,40,000) සහ දොලොස් ලක්ෂ හතලිස් දෙදහස් නවසිය හතලිස් හතර (රු. 12,42,944) අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර සීමාසහිත ඩලස් කෙලාර්ට්ස් පුද්ගලික සමාගම විසින් එකී අංක 10651 සහ අංක 569 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### ඉහත කී උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කිණිගොඩ කෝරළයේ, දෙයාලදහමුණ පත්තුවේ මහගොඩ ගමේ පිහිටි උණගහපිටියෙ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එස්. එම්. අජ්වාඩ් මහතා විසින් 2008.08.22 වැනි දින මැන සාදන ලද අංක 6224/2008 දරන පිඹුරුපතෙහි කැබලි අංක 02 දරන ප්‍රමාණයෙන් අක්කර එකයි, පර්චස් තිස්පහක් (අ. 1, රූ. 0, පර්. 35) විශාල ඉඩමට මායිම්, උතුරට : නිවාසවලට යන පාර, නැගෙනහිරට : දුරමුල්ලේවත්ත සහ ඇල, දකුණට : ලොට් අංක 01, බස්නාහිරට : පාර සහ 6224/2008 පිඹුරේ ලොට් 01 ද යන මායිම් තුළ ඇති ඉඩම සහ එහි තුළ ඇති ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේද වේ.

ඉහත දේපළ පහත දේපළින් බෙදා මැන සාදන ලද කොටසකි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කිණිගොඩ කෝරළයේ, දෙයාලදහමුණ පත්තුවේ, රඹුක්කන ප්‍රාදේශීය සභා සීමාව තුළ මහගොඩ ගමේ පිහිටි උණගහපිටියේ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. බී. රණතුංග මහතා විසින් 2006.06.19 වැනි දින මැන සාදන ලද අංක 5875 දරන පිඹුරුපතේ පෙන්නුම් කෙරෙන කැබලි අංක 01 දරන ප්‍රමාණයෙන් අක්කර එකයි, රූඩ් දෙකයි, පර්චස් තිස්පහක් (අ. 1, රූ. 2, පර්. 35) ක් විශාල ඉඩමට මායිම්, උතුරු-නැගෙනහිරට : පාර සහ ගුණවර්ධන ඩී. ජී. සිරිසේන හිමිකම් කියන දුරමුල්ලේවත්ත ද, නැගෙනහිරට : ඇල සහ දුරමුල්ලේවත්ත ද, දකුණු-බස්නාහිරට : වික්ටර් අතුකෝරළ, අසේල බණ්ඩාර, ආරියතිලක හිමිකම් කියන උණගහපිටියෙවත්ත ද, බස්නාහිරට : පාර සහ උණගහපිටියවත්ත ද යන මායිම් තුළ පිහිටි ඉඩම සහ එහි තුළ ඇති ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේද සහ දේපළට ඇති සියලු මාර්ගවල මාර්ග පරවශ්‍යතා අයිතිය ද සමග වේ.

මෙම ඉඩම කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී455/147 හා බී491/68 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කෑගල්ල.

06-84

---

### හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. - හෝමාගම ශාඛාව
### (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

දොන් ප්‍රදීප් සඳරුවන් සේනාධීර.

2010.04.29 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. සේනානායක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.04.10 වැනි සහ අංක 1970 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දොන් ප්‍රදීප් සඳරුවන් සේනාධීර යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිනවලක්ෂ දෙදහස් හාරසිය අනූහතයි ශත විසිහය (රු. 29,02,497.26) ක මුදලක් 2010.03.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 29,02,497.26ක මුදලට 2010.04.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1970 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එච්. දළුවත්ත මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවෙහි, කඩුවෙල ඒකකය තුළ මාලබේ පිහිටි "අළුබෝගහවත්ත සහ දෙල්ගහවත්ත හෙවත් බටදොඹගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 4890 සහ 1998 අගෝස්තු මස 21 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඒ ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : අයි. ධර්මදාස හිමිකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට : පිඹුරු අංක 1889ට අයත් ලොට් 2න් ද සහ පිඹුරු අංක 1292ට අයත් ලොට් 3 හි කොටසකින් ද, දකුණට : බලයලත් මානක ඒ. ඊ. විජේසූරිය විසින් මැන සාදන ලද අංක 1292 දරන පිඹුරට අයත් ලොට් 4 න් ද සහ බස්නාහිරට : පාරෙන් ද මායිම් වූ පර්චස් දහඅටයි දශම දෙක (අ. 0, රූ. 0, පර්. 18.2) විශාල ඉඩම අංක 4890 දරන පිඹුර ප්‍රකාර වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

06-117/3

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ අභියෝජනාව

ගිණුම් අංකය : 1050083501.
ණය ගිණුම් අංකය : 280880.
නැප්චූන් සෝල්ට් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2009 ඔක්තෝබර් මස 23 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. සී. එස්. ජයසූරිය විසින් 2008 ජනවාරි මස 29 වැනි දින සහතික කරන ලද අංක 615 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගාල්ලේ කොටුවේ තරුණ බෞද්ධ සංගම් ගොඩනැගිල්ලේ පළමු වන මහලේ ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන සමාගම් ආඥාපනත ප්‍රකාර ස්ථාපිත නැප්චූන් සෝල්ට් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමය ණයකරු හැටියට ද කැටගොඩ ගමගේ මනෝරි පෙරේරා උකස්කරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් ද (ඉඩම සහ පරිශ්‍රය මෙහි 1 වැනි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත.)

ගාල්ලේ ප්‍රසිද්ධ නොතාරිස් අයි. එස්. විජේසේකර විසින් 2006 ජනවාරි මස 30 වැනි දින සහතික කරන ලද අංක 2194 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි නමට ලියන ලද්දාවූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගාල්ලේ උළුවිටිකේ (මීට පෙර ගාල්ලේ, කොටුවේ තරුණ බෞද්ධ සංගම් ගොඩනැගිල්ලේ පළමුවන මහලේ) ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන සමාගම් ආඥාපනත ප්‍රකාර ස්ථාපිත නැප්චූන් සෝල්ට් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමය ණයකරු හැටියට ද, ඔපිට පතිරණගේ පුණ්‍ය කීර්ති දේවප්‍රිය නොහොත් ඔපිට පතිරණගේ දේවප්‍රිය පුන්‍ය කීර්ති උකස්කරු හැටියට ද පැහැර හැර ඇති හෙයින් ද, (ඉඩම සහ පරිශ්‍රය මෙහි 2 වැනි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත.)

දැන් එකී බැඳුම්කර යටතේ රුපියල් හැටපන් ලක්ෂ විසි අටදහස් හැට දෙකක (රු. 65,28,062) මුදලක් 2009 මැයි මස 18 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් හැටපන් ලක්ෂ විසි අටදහස් හැට දෙකක (රු. 65,28,062) මුදල අයකර ගැනීම සඳහා 2009 මැයි මස 19 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 36,06,200.28ක මුදල මත 29%ක වැඩිදුර වාර්ෂික පොළිය ද, රු .23,74,900 මුදල මත 22% වැඩිදුර වාර්ෂික පොළිය ද, රු. 13,39,308.49ක මුදල මත 15.5% වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් ද දරන ලද වෙනත් වියදම් ද මෙතෙක් ලබාගෙන ඇති ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 615 හා 2194 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි 1 වැනි සහ 2 වැනි උපලේඛනයන්හි සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ස්ඩෝෆ් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### 1 වැනි උපලේඛනය

බලයලත් මානක පී. ෆීලික්ස් ඩයස් විසින් 1997.10.11 වැනි දින සාදන ලද අංක 1024 (එච්. එස්. පෙරේරා විසින් 1975.10.19 වැනි දින සාදන ලද පිඹුරු අංක 128/1975 හි ලොට් ඒ හි නැවත මිණුම් කළ අතුරු බෙදීමක් සේ දක්වන) දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ තලංගම දකුණේ පිහිටි හික්ගහවත්ත හෙවත් තල්ගහවත්ත කියන ඉඩමේ ගහකොළ, වගාවන් සහ එහි මතුපිට පවත්නා අනෙකුත් සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 6 දරන කොටසට මායිම්, උතුරට : ලොට් 5 සහ 7 (අඩි 15 පළල මාර්ග වෙන්කර) ද, නැගෙනහිරට : කේ.

සියදෝරිස් පෙරේරා හිමිකම් කියන හික්ගහවත්ත ද, දකුණට : හෙන්ද්‍රික් පෙරේරා හිමිකම් කියන හික්ගහවත්ත සහ එළාරිස් පෙරේරා සේනාරත්න හිමිකම් කියන තල්ගහවත්ත ද සහ බටහිරට : කේ. සියදෝරිස් පෙරේරා සහ වෙනත් අය හිමිකම් කියන තල්ගහවත්ත සහ එළාරිස් පෙරේරා සේනාරත්න හිමිකම් කියන තල්ගහවත්ත ද යන මායිම් තුළ රූඩ් එකයි, පර්චස් තුනයි දශම නවයයි එකක් (අ. 0, රූ. 1, පර්. 3.91) විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1153/33 වෙළුම/පිටුව යටතේ ලියාපදිංචි කර ඇත.

මෙහි දක්වන මාර්ග වෙන්කරය තුළින් මතින් සහ ඔස්සේ ගමනාගමනය සඳහා වන අයිතිය ද ඇතුළුව ය :

බලයලත් මානක පී. ෆිලික්ස් ඩයස් විසින් 1997.10.11 වැනි දින සාදන ලද අංක 1024 (එච්. එස්. පෙරේරා විසින් 1975.10.19 වැනි දින සාදන ලද පිඹුරු අංක 128/1975 දරන පිඹුරෙහි ලොට් ඒ හි නැවත මිනුමක් කර අතුරු බෙදීමක් සේ දක්වන) දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දකුණු තලංගම පිහිටි හික්ගහවත්ත හෙවත් තල්ගහවත්ත කියන ඉඩමේ පිහිටි ගසකොළ, වගාවන් සහ එහි මතු පිට පවත්නා අනෙකුත් සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 7 දරන කොටසට මායිම්, උතුරට : ලොට් 5 සහ 2 ද, නැගෙනහිරට : කේ. සියදෝරිස් පෙරේරා හිමිකම් කියන හික්ගහවත්ත සහ දොළ පාර ද, දකුණට : ලොට් 6 ද සහ බටහිරට : ලොට් 3, 4 සහ 5 ද යන මායිම් තුළ පර්චස් දහහතයි දශම තුනයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 17.32) විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී1153/34 වෙළුම/පිටුව යටතේ ලියාපදිංචි කර ඇත.

රොබට් ගුණවර්ධන නමැති ප්‍රසිද්ධ පාර මතු පිටින් සහ ඔස්සේ යා හැකි අයිතිය ද ඇතුළුව ය.

### 2 වැනි උපලේඛනය

බලයලත් මානක ඒ. වීරසිංහ විසින් 2004 සැප්තැම්බර් මස 07 වැනි දින සාදන ලද අංක 770A (බලයලත් මානක ඒ. වීරසිංහ විසින් සාදන ලද අංක 770 දරන පිඹුරෙහි වෙන් කරන ලද යාබද බිම් කොටස වන 3A1 සහ 3A2 නැවත මැන ඒකාබද්ධ කිරීමක් සේ දැක්වෙන) සහ ලොට් 3බී (බලයලත් මානක ඒ. වීරසිංහ විසින් 1995 මැයි මස 17 වැනි දින සාදන ලද අංක 333 දරන පිඹුරේ දැක්වෙන) දරන දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, කඩවත් සතර ඇතුළත උළුවිටිකේ පිහිටි වලකඩවත්ත කියන ඉඩමේ ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ එහි පවතින් අනෙකුත් සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 3 ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමටම අයත් ලොට් 2 ද, නැගෙනහිරට : කුරහකමුල්ලේ කුඹුර සහ එහි ඉඩමටම අයත් ලොට් 4 ද, දකුණට : එම ඉඩමටම අයත් ලොට් 4 ද සහ බටහිරට : ගල්දූව වෙන් කරන මාර්ග වෙන්කරය සහ එම ඉඩමටම අයත් ලොට් 2 ද යන මායිම් තුළ එකී පිඹුරුපත් අංක 770A පරිදි යන මායිම් තුළ රූඩ් එකයි, පර්චස් දහහතක් (අ. 0, රූ. 1, පර්. 17) හෝ හෙක්ටයාර් 0.1442 විශාල ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A612/53 වෙළුම/පිටුව යටතේ ලියාපදිංචි කර ඇත.

සම්පූර්ණ නිදහසේ ඇවිදීමේ අයිතිය, ඇතුල්වීමේ සහ පිටවීමේ අයිතිවාසිකම්, යාම් ඊම් කිරීමේ අයිතිය, ඉදිකිරීමේ බිද දැමීම්, විදුලිය සහ උඩින් යටින් ජල සැපයුම් සේවා පිහිටුවීම ප්‍රධාන විදුලි කම්බි ද බෙදා වෙන් කරන ලද මාර්ග වෙන්කරය තුළින්, මතුපිටින්, යටින් සහ දිගේ ප්‍රධාන පාරේ සිට පිඹුරුපත් අංක 770A හි දැක්වෙන ලොට් 3 දක්වා ගෙනයාමේ බාධා රහිත අයිතිය ද ඇතුළුව ය.

ආර්. ආර්. දුනුවිල මහත්මිය.<br>
සමාගම් ලේකම්.

06-63

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - ගාල්ල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

අංගුලුගහ ගමගේ අමල් ප්‍රසන්න වතවන විතානවසම් තනුජා දිල්රුක්ෂි.

2010.03.31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. එස්. මරික්කාර් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.02.02 වැනි සහ අංක 10349 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අංගුලුගහ ගමගේ අමල් ප්‍රසන්න වතවන විතානවසම් තනුජා දිල්රුක්ෂි යන අය ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ අනූඑක්දහස් දෙසිය හැත්තෑදෙකයි ශත (රු. 5,91,272.30) ක මුදලක් 2010.02.26 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 5,91,272.30ක මුදලට 2010.02.27 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 10349 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, අංගුලිගහ "වුතුප්පිටියමුල්ලේ බැද්ද" නමැති ඉඩමට බලයලත් සී. ගුණවර්ධන විසින් ලියා සහතික කරන ලද 2006.10.06 වැනි දිනැති අංක 714 පිඹුරෙහි ලොට් අංක 1 සිට 4 නමැති ඉඩමට මායිම්, උතුරට : ගාල්ල සිට මොරවක්කෝරළේ දක්වා ඇති පී ඩබ් ඩී පාරෙන් ද, නැගෙනහිරට : ලොට් අංක 8 සහ ටොකැටියමුල්ල වත්තෙන් ද, දකුණට : ලොට් අංක 5, 8 සහ පාර සඳහා ලකුණු කරන ලද ලොට් අංක 7න් ද, සහ බස්නාහිරට : ලොට් අංක 7 ලෙස ලකුණු කරන ලද පාරෙන් ද මායිම් වූ දහතුනයි දශම පහයි හය (අ. 0, රූ. 0, පර්. 13.56) ක් හෝ හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි තුනයි හතරයි තුන (0.0343)ක් විශාල ඉඩම සහ සියලු දේත් සමග වේ. මෙම ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 921/23 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,<br>
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),<br>
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

06-117/2

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - අලුත්ගම ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

බමුණුගේ සමන් විජිත කුමාර ද සිල්වා.

2010.03.31 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2008.05.23 සහ අංක 2398 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම බමුණුගේ සමන් විජිත කුමාර ද සිල්වා යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දොලොස් ලක්ෂ දෙදහස් පන්සිය හැත්තෑදෙකයි ශත හැත්තෑහතර (රු. 12,02,572.74) ක මුදලක් 2009.06.14 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 12,02,572.74ක මුදලට 2009.06.15 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2398 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, දකුණු තොටමුණ, කළුතර අලුත්ගම බැද්ද බේරුවල ප්‍රාදේශීය සභා සීමාවේ මාලේවන බැද්ද උප කාර්යාල සීමාවේ, කළුවාමෝදර ගමේ පිහිටි වැල්ලෙබොඩහීන්දිගන නමැති ඉඩමට බලයලත් මානක ජී. එල්. ඩබ්. පෙරේරා විසින් ලියා සහතික කරන ලද 2000.05.25 දිනැති අංක 1830 පිඹුරෙහි ලොට් අංක 2 නමැති ඉඩමට මායිම්, උතුරට : ලොට් අංක 1 න් ද, නැගෙනහිරට : පාරෙන් ද, දකුණට : පාරෙන් ද සහ බස්නාහිරට : මුල්ලපිටියට අයත් ඉඩමෙන් ද මායිම් වූ පර්චස් විස්සයි දශම හයයි බින්දුව (අ. 0, රූ. 0, පර්. 20.60) විශාල ඉඩම සහ සියලු දේත් සමග වේ. මෙම ඉඩම කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 232/274 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

06-117/1

## මහජන බැංකුව - වේයන්ගොඩ ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2006.12.26 දිනැති අංක 11968 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් නාරනාපිටි පතිරන්නැලාගේ චාන්දනී ජයමිණි යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දෙලක්ෂ පනස් හත්දහස් හැට හතයි ශත පනස්එක (රු. 2,57,067.51) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2009.04.27 වැනි දින සිට වර්ෂයකට 18.5% බැගින් රුපියල් දෙලක්ෂ පනස්හත් දහස් හැට හතයි ශත පනස්එක (රු. 2,57,067.51)ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දෙලක්ෂ පනස්හත් දහස් හැට හතයි ශත පනස්එක (රු. 2,57,067.51) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඩලස් කෙලාර්ට්ස් වෙන්දේසිකාර (පුද්ගලික) සමාගම විසින් එකී අංක 11968 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතුයැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කරන ලද දේපළ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ මැද පත්තුවේ, උතුවන් බෝගහවත්ත සහ උඩගම පිහිටි ජේතවන ස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක ආර්. අයි. ඩී. එම්. බණ්ඩාර 1998.01.22 දින හා 1998.11.18 පිඹුරු අංක 288ට අනුව කැබලි අංක 99ට මායිම්, උතුරට : ලොට් අංක 45, නැගෙනහිරට : ලොට් අංක 100ඒ, දකුණට : පිඹුරු අංක 4165හි සඳහන් ලොට් සී, බස්නාහිරට : ලොට් අංක 96 යන මායිම් තුළ පිහිටි පර්චස් පහළව (අ. 0, රූ. 0, පර්. 15)ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

එකී පිඹුරේ පාරවල් සඳහා වෙන් කළ කොටස්වල මාර්ග අයිතිය ද සමග වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක ඊ 748/209 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

06-83

### මහජන බැංකුව - වාලච්චේනයි ශාඛාව

### 1986 වර්ෂයේ අංක 32 දරන පනතේ සංශෝධිත 1961 වර්ෂයේ අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ වූ තීරණය

2006.06.28 වැනි දින පවත්වන ලද මහජන බැංකු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ 1986 අංක 32 දරන පනතේ සංශෝධිත වූ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී වගන්තිය අනුව පහත සඳහන් තීරණය ඒකමතිකව තීරණය ගත් බව මෙයින් දන්වා සිටිමි.

මහජන බැංකුව වෙනුවෙන් මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. විජයකුමාර් මහතා විසින් 2004.06.01 වැනි දින සහතික කරන ලද අංක 483 දරන බැඳුම්කරය වෙනුවෙන් වූ ගෙවීම ගෙවීමට ජනාප් මොහිඩීන් මොහොමඩ් බුහාරි මයා පැහැර හැරීම නිසාත් එකී බැඳුම්කරය මගින් දැනට රුපියල් විසිහත් ලක්ෂ අට දහස් තුන්සිය තිස් එකක් (රු. 27,08,331) මහජන බැංකුවට ගෙවීමට තිබෙන නිසාත් මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 1986 වර්ෂයේ අංක 32 දරන පනතේ සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් බැංකුවේ උකස් කරන ලද දේපළ හා ඉඩම බලයලත් මිනින්දෝරු අලෙක්සාන්ඩර් ඉමෙනුවෙල් කිංස්ටන් තිස්සවීරසිංහ මහතා අංක 08, මුදලියාර් පාර, මඩකලපුව මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ඒ මගින් උක්ත මුදල් වන රුපියල් විසිහත් ලක්ෂ අටදහස් තුන්සිය තිස් එකක් ද, (රු. 27,08,331) ඒ සමග 2005.11.26 වැනි දින සිට විකුණුම් දින දක්වා රු. 27,08,331 මත 18% පොලිය ද පෙන්නුම් කර ඇති මහජන බැංකු ආඥාපනත 29 වැනි වගන්තිය යටතේ අයවිය යුතු වියදම් හා අතරතුරු යම්කිසි මුදලක් ගෙවා ඇත්නම් එය අඩුකර අයකළ යුතු බව මෙයින් නියම කරනු ලැබේ.

#### උකස්කරන ලද දේපළ විස්තර

*ඉඩම - 01*

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලයිපත්තු, බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඕට්ටමාවඩි ප්‍රාදේශීය සභා සීමාව තුළ ඔට්ටමාවඩි ගම්මානයේ කොට්ඨාස අංක 01, එස්. එම්. ටී. හාපියාර් වීදියේ පිහිටා ඇති වෙම්පු වලවු යනුවෙන් සඳහන් කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල ගොඩනැගිලි, ගස්, වතු, බිම හා එහි අඩංගු සියලු දේ සමග මෙම ඉඩම බලයලත් මිනින්දෝරු එස්. නාගලිංගම් මහතා විසින් 2002.10.04 වැනි දින සකස් කරන ලද අංක එස්. එන්. 02/5165 බිම් සැලැස්මේ කාණ්ඩ 01 යනුවෙන් පෙන්නුම් කර ඇත. මායිම් උතුරට : එම්. එම්. බුහාරි මහ බිරිඳට අයත් ඉඩම, නැගෙනහිරට : කාණ්ඩ අංක 02, දකුණට : එස්. එම්. ටී. හාපියාර් පාර සහ අනිකුත් අයගේ ඉඩම, බටහිරට : එස්. එම්. ටී. හාපියාර් පාර, විස්තීරණය පර්චස් තිස්තුනයි (අ. 0, රූ. 0, පර්. 33) මෙම ඉඩම මඩකලපුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක G175/251 යටතේ ලියාපදිංචි කර ඇත.

*ඉඩම - 02*

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලයිපත්තු බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඔට්ටමාවඩි ප්‍රාදේශීය සභා සීමාව තුළ ඕටටමාවඩි ගම්මානයේ කොට්ඨාස අංක 01, එස්. එම්. ටී. හාපියාර් වීදියේ පිහිටා ඇති වෙම්පු වලවු යනුවෙන් සඳහන් කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල ගොඩනැගිලි, ගස්, වතු, බිම හා එහි අඩංගු සියලු දේ සමග මෙම ඉඩම බලයලත් මිනින්දෝරු එස්. නාගලිංගම් මහතා විසින් 2002.10.04 වැනි දින සකස් කරන ලද අංක එස්. එන්. 02/5165 බිම් සැලැස්මේ කාණ්ඩ 02 යනුවෙන් පෙන්නුම් කර ඇත. මායිම් උතුරට : එම්. එම්. බුහාරි සහ බිරිඳට අයත් ඉඩම්, නැගෙනහිරට : පාර, දකුණට : සුලයිහා උම්මාට අයත් ඉඩම, බටහිරට : කාණ්ඩ අංක 01 විස්තීරණය රූඩ් එකයි පර්චස් දෙකයි දශම පහයි (අ. 0, රූ. 1, පර්. 2.5) මෙම ඉඩම මඩකලපුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක G177/251 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
මඩකලපුව.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 25/1, කෝවින්දන් වීදිය,
මඩකලපුව.

06-81

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධන කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

ණය ගැනුම්කරුගේ නම : සීමාසහිත බගතලේ (පුද්ගලික) සමාගම.
අධ්‍යක්ෂවරුන්ගේ නම් : එස්. පුෂ්පරාසා මහතා, එස්. තිරුවරුල් මහතා,
ලිපිනය : අංක 162A, වුල්පෙන්ඩාල් වීදිය, කොළඹ 13

2010.03.18 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් එස්. එච්. රණවක විසින් සහතික කරන ලද 2007.10.03 දිනැති අංක 2268 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2010.01.31 දින තෙක් පොලිය වශයෙන් රුපියල් එක්කෝටි අසූතුන්ලක්ෂ අනූතුන්දහස් එකසිය හැටයි ශත තුනක (රු. 1,83,93,160.03) මුදලක් සහ රුපියල් එක්කෝටි හතලිස් තුන්ලක්ෂ හැත්තෑඅටදහස් නවසිය පනස් නවයයි ශත විස්සක (රු. 1,43,78,959.20) මුදලක් මත වසරකට සියයට දාහතර (14%) බැගින් පොලියක් ද, 2010.02.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කොළඹ 13, වුල්පෙන්ඩාල් වීදිය, අංක 162/A හි සීමාසහිත බගතලේ (පුද්ගලික) සමාගම වෙතින් අයවිය යුතුව ඇත.

2. එකී අංක 2268 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් එක්කෝටි අසූතුන්ලක්ෂ අනූතුන්දහස් එකසිය හැටයි ශත තුනක (රු. 1,83,93,160.03) මුදල සමග 2010.02.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතුව පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3හි පදිංචි T & H ඔක්ෂන්ස් මහත්වරුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකුව ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, අගනුවර ශාඛාවේ, අයකර ගැනීමේ හා ණය සුපරීක්ෂණ දෙපාර්තමේන්තුවේ, කළමනාකාරිණියට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ බම්බලපිටිය කොට්ඨාස අංක 38හි කොල්ලුපිටියෙහි පහල බගතලේ පාර දිගට පිහිටි කොල්ලුපිටිය පාරේ, වරිපනම් අංක 562/17 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. රාසප්පා විසින් සාදන ලද 2006 සැප්තැම්බර් මස 01 වැනි දිනැති අංක 457/2006 දරන පිඹුරෙහි ලොට් 3A ලෙස දක්වා සීමා නිර්ණය කර නිරූපණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් 3A, උතුරට : පෞද්ගලික පාර ද, නැගෙනහිරට : ලොට් 3B ද, දකුණට : පහල බගතලේ පාර ද, බස්නාහිරට : කොල්ලුපිටිය පාරේ වරිපනම් අංක 562/16A දරන පිඹුරු අංක 56හි ලොට් 4 ද මායිම්ව එකී අංක 457/2006 දරන පිඹුර ප්‍රකාර පර්චස් අටයි දශම හතයි හයක (අ. 0, රූ. 0, පර්. 8.76) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A1038/228හි ලියාපදිංචි කර ඇත.

එකී කොල්ලුපිටියේ පහළ බගතලේ පාර දිගට පිහිටි කොල්ලුපිටිය පාරේ, වරිපනම් අංක 562/17 දරන ඉඩමෙහි අංක 457/2006 දරන එකී පිඹුරෙහි ලොට් 3B ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 3B උතුරට : පුද්ගලික පාර ද, නැගෙනහිරට : කොල්ලුපිටිය පාරේ වරිපනම් අංක 562/18 දරන අංක 56 දරන පිඹුරෙහි ලොට් 2 ද, දකුණට : පහළ බගතලේ පාර ද. බස්නාහිරට : ලොට් 3A ද මායිම්ව එකී අංක 457/2006 දරන පිඹුර ප්‍රකාර පර්චස් අටයි දශම හතයි හයක (අ. 0, රූ. 0, පර්. 8.76) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියළු දේ ද වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A1038/229හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අයි. එම්. පණ්ඩිතරත්න මිය,
කළමනාකාරිණී,
අයකර ගැනීම් හා ණය සුපරීක්ෂණ.

ලංකා බැංකුව,
අගනුවර ශාඛාව,
අයකර ගැනීම් හා ණය සුපරීක්ෂණ දෙපාර්තමේන්තුව,
යෝර්ක් වීදිය.

06-68

---

### මහජන බැංකුව - ගම්පහ ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.07.31 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විජිත ඒ ද විසින් සහතික කරන ලද 2004.05.28 දිනැති අංක 1364 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, රූපසිංහ ආරච්චිගේ ලලිත් උදයකුමාර රූපසිංහ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දස ලක්ෂයක (රු. 10,00,000) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2009.01.01 දින සිට වර්ෂයකට 19.25% බැගින් රුපියල් දස ලක්ෂයක (රු. 10,00,000) මුදලකට සඳාහ වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දස ලක්ෂයක (රු. 10,00,000) මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඩලස් කෙලාට්ස් වෙන්දේසිකාර (පුද්ගලික) සමාගම විසින් එකී අංක 1364 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතුයැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, පහළ ඉඹුල්ගොඩ ගමේ පිහිටි මිල්ලගහවත්ත සහ දෙල්ගහවත්ත කැබැල්ල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. කේ. එන්. එස්. ජයකොඩි මහතා විසින් 1998.12.13 දින මැන සකස් කළ පිඹුරු අංක 100හි ලොට් 4 දරන බිම් කොටසට මායිම්, උතුරු-නැගෙනහිරට : වයි. ඩී. ඒ ජයසිංහ හාමිනේට අයත් ඉඩම ද, දකුණු-නැගෙනහිරට : ලොට් 5 ද, දකුණු-බස්නාහිරට : ජේ. ඒ. ජේ. ද සී. පෙරේරාට අයත් ඉඩම ද, උතුරු-බස්නාහිරට : ලොට් අංක 3 සහ 2 යන මායිම් තුළ පිහිටි පර්චස් එකොළහයි දශම හත (අ. 0, රූ. 0, පර්. 11.7) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

මෙම සුරැකුම මත අංක 1363 දරන 2004.05.28 දිනැති උකස්කරය යටතේ ප්‍රදානිත රුපියල් දස ලක්ෂයක (රු. 10,00,000) ණය මුදලක් ක්‍රමික ගණයේ පවතී.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක 548/251හි ලියාපදිංචි කර ඇත.

එකී පිඹුරේ පාරවල් සඳහා වෙන්කළ කොටස් වල මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

06-82

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 360951, 415508
ගිණුම් අංකය : 1130021376.

2009 ඔක්තෝබර් මස 23 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ෆෙලිෂියන් ෆර්නෑන්ඩෝපුල්ලේ විසින් 2007 අප්‍රේ මස 24 වැනි දින සහතික කරන ලද අංක 9549 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එල්. ජයවීර විසින් 2007 දෙසැම්බර් මස 20 වැනි දින සහතික කරන ලද අංක 2661 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මා(ර්)ලන්ස් යන නාමය සහ විලාශයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ඇන්තනි සුසිල් ලසන්ත ද සිල්වා බන්ධනදායී හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දොළොස් මිලියන තුන්සිය නව දහස් පන්සිය හැට හතරයි ශත දොළහක (රු. 1,23,09,564.12) මුදලක් 2009 සැපැත්මබර් මස 07 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දොළොස් මිලියන තුන්සිය නව දහස් පන්සිය හැට හතරයි ශත දොළහක (රු. 12,309,564.12) මුදල අයකර ගැනීම සඳහා 2009 සැප්තැම්බර් මස 08 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 18,24,917.06ක මුදල මත 29%ක වැඩිදුර වාර්ෂික පොලියක් ද, රු. 83,24,600ක මුදල මත 26% වැඩිදුර වාර්ෂික පොලියක් ද. ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ දරන ලද වෙනත් වියදම් ද මෙතෙක් ලබාගෙන ඇති ගෙවීම් වෙතොත් ඒවා ද, අඩුකොට එකී අංක 9549 සහ 2661 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කොට ඇත්තාවූ ද, මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ අංක 99හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බලයලත් මානක ඊ. ජේ. ආර්. ද වාස් විසින් 1930 ජනවාරි මස 10 වැනි දින සාදන ලද අංක 143 දරන පිඹුරෙහි බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහ නගර සභා සීමාවන් තුළ හුනුපිටිය 2 වැනි කොට්ඨාසයේ පිහිටි පොකුණබඩවත්ත කියන ඉඩමේ ගොඩනැගිලි, වගාවන් සහ මතුපිට පවත්නා අනෙකුත් සියළු දේත් සමග ලොට් X ලෙස සලකුණු කළ ඉඩමට මායිම්, උතුරට : ප්‍රධාන පාර ද, දකුණට : ලොට් Y ද, බටහිරට : ලොට් Y සහ නැගෙනහිරට : එම් මාගරට් පීරිස්ගේ ගොරකගහවත්තද යන මායිම් තුළ පර්චස් දහඅටයි දහසයෙන් දෙකක් (අ. 0, රූ. 0, පර්. 18 2/16) විශාල ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A211/310 වෙළුම/පිටුව යටතේ ලියාපදිංචි කර ඇත.

ඉතා මෑතක දී සාදන ලද පිඹුරක් පරිදි මෙය මෙසේ විස්තර කර ඇත.

බලයලත් මානක ඩී. පී. විමලසේන විසින් 2007 මාර්තු මස 27 වැනි දින සාදන ලද අංක 6301 දරන පිඹුරෙහි එකී හුණුපිටිය 2 වැනි කොට්ඨාසයේ පිහිටි පොකුණබඩවත්ත කියන ඉඩමේ ගොඩනැගිලි එහි මතුපිට පවත්නා අනෙකුත් සියළු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස සලකුණු කර දැක්වෙන ඉඩමට මායිම්, උතුරට : හලාවත් පාර ද, නැගෙනහිරට : ජී. ඒ. ජී. එස්. පෙරේරාගේ ඉඩම ද, දකුණට : ජී. ඒ. ජී. එස්. පෙරේරාගේ ඉඩම සහ ඩී. ජේ. විජේතුංගගේ ඉඩම ද සහ බටහිරට : ඩී. ජේ. විජේතුංගගේ ඉඩම ද, සහ ඩබ්ලියු. ඩී. ක්ලොටිල්ඩා ලන්සාගේ ඉඩම ද යන මායිම් තුළ එකී පිඹුරු පත් අංක 6310 පරිදි පර්චස් දහහතක් විශාල ඉඩම.

ආර්. ආර්. දුනුවිල මහත්මිය.
සමාගම් ලේකම්.

06-67

### මහජන බැංකුව - පුරහල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වර්ෂයේ අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.07.31 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. එස්. ඩබ්. අමරසිංහ මහත්මිය විසින් සහතික කරන ලද 2007.09.27 දිනැති අංක 7942 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, සමරතුංග මුහන්දිරම්ගේ දොන් තිලක් චන්ද්‍රසිරි මහතා යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින්, එකී අංක 7942 දරන උකස්කරය යටතේ දැනට රුපියල් දෙලක්ෂ තිස්එක්දහසක් (රු. 2,31,000) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින්, එම මුදල සහ එකී රුපියල් දෙලක්ෂ තිස්එක්දහසක (රු. 2,31,000) මුදල සඳහා 2008.09.03 දින සිට වර්ෂයකට 22% බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල් අයකර ගැනීම සඳහා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. එස්. ඩබ්. අමරසිංහ මහත්මිය විසින් 2007.09.27 දින සහතික කළ අංක 7942 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් කොළඹ බලයලත් වෙන්දේසිකාර අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ නේදේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, ගඟබඩ පත්තුවේ, උඩ කනම්පැල්ල යන ගම තිබෙන අරන්පන්වත්තේ කැබැල්ල කියන උතුරට : මෙම ඉඩමේ කොටසක පැළඉණි වැට ද, නැගෙනහිරට : සමරතුංග මුහන්දිරම්ගේ දොන් ග්‍රිගෝරිස්ගේ ඉඩමේ පැළඉණි වැටිය ද, දකුණට : පින්නලවත්තගේ දොන් ස්නේගුට අයිති කැබැල්ලේ පැළඉණි වැටිය ද, බස්නාහිරට : කාලාවෙලේ ඕවිටේ අගල ද යන මෙකී මායිම් තුළ වී බුසල් එකක් පමණ වපසරිය ඇති ඉඩම සහ ඊට අයිති ගසකොල, පළතුරු ආදී සෑම සියළු දේ ද සමග වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඩී 232/93හි ලියාපදිංචි කර ඇත.

ඉහත ඉඩම නව මිනුමකට අනුව පහත අන්දමට විස්තර වේ :-

ඉහත දැක්වෙන ඉඩමට බලයලත් මිනින්දෝරුතැන 1995.03.14 වැනි දින එල්. ජේ. ලියනගේ විසින් මැන සාදන ලද අංක 6931 දරන පිඹුරට අනුව බෙදා වෙන් කළ කොටසට මායිම්, උතුරට : ඩබ්ලිව්. ඩී. අන්තෝනිට අයිති ඉඩම ද, නැගෙනහිරට : සමරතුංග මුහන්දිරම්ගේ දොන් ප්‍රන්සිස්ට අයිති ඉඩම ද, දකුණට : පින්නලවත්තගේ දොන් ස්නේගුට අයිතිව තිබී දැනට සමරතුංග මුහම්දිරම්ගේ දොන් ප්‍රැන්සිස්ට අයිති අංක 1430 පිඹුරේ බී කැබැල්ල ද, සහ බටහිරට : කාලාවෙලේ ඕවිට වෙන්වන බෝයහගොඩැල්ල පාර ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හයයි දශම පහක් (අ. 0, රූ. 1, පර්. 6.5) විශාල ඉඩම් කොටස සහ ඊට අයිති ගසකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියළු දේ ද සමග වේ.

මෙය ගම්පහ ඉඩම් කාර්යාලයේ ඩී 232/93හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
(කොළඹ දකුණ).

සහකාර සාමාන්‍යාධිකාරී,
මහජන බැංකුව,
කලාප ප්‍රධාන කාර්යාලය,
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

06-86

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධන කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010.03.18 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :-

1. මහජන නොතාරිස් කේ. ඩී. විමලදාස විසින් සහතික කරන ලද 1994.08.24 දිනැති අංක 655 දරන බැඳුම්කරය, මහජන නොතාරිස් එස්. බී. සංගක්කාර මහතා විසින් සහතික කරන ලද 1995.12.28 දිනැති අංක 1620 දරන බැඳුම්කරය හා 1998.12.01 දිනැති අංක 1806 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009.11.04 දින තෙක් පොළිය වශයෙන් රුපියල් තිස්පන් ලක්ෂ පනස් නව දහස් දොලහයි ශත පහක (රු. 35,59,012.05) මුදලක් සමග රුපියල් විසිහය ලක්ෂ තිස්නව දහස් විසිදෙකයි ශත විසිතුනක මුදලක් මත වසරකට සියයට විසිපහ (25%) බැගින් පොළියක් ද, 2009.11.05 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් බකමූණ, යොවුන් කඳවුර, අංක 18, "මල්ෂා හාල් මෝල" හි පදිංචි උඩවෙල ගෙදර කපිලරත්න මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 1806, 1620, 655 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් තිස්පන් ලක්ෂ පනස් නව දහස් දොලහයි ශත පහක (රු. 35,59,012.05) මුදල සමග 2009.11.04 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතුව පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරින්ටන් පාර, අංක 24හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, බකමූණ ශාඛාවේ, කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### පළමුවැනි උපලේඛනය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, ඇලහැර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ සිංහල පත්තු සුළු කොට්ඨාසයේ, අංක 70H දරන බකමූණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බකමූණ පිහිටි, බලයලත් මිනින්දෝරු ආර්. බී. අබේකෝන් විසින් සාදන ලද 1994.02.16 දිනැති අංක 554 දරන පිඹුරෙහි "බකමූණ තරුණයන් පදිංචි කරවීමේ යෝජනා ක්‍රමය" නමැති ඉඩමෙහි ලොට් අංක 01 ලෙස නිරූපිත එසේම 1998.01.22 දිනැති අංක E. KO 3/4/2/141 දරන L. D. O. බලපත්‍රයෙහි විස්තර කර ඇති "ගොඩ" නමැති එමෙන්ම ලොට් 18 ලෙස දක්වා සීමා නිර්ණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එකී අංක 554 දරන පිඹුරට අනුව උතුරට : TOPO P. P. 25 හි ලොට් අංක 1063 හා 1065 ද, නැගෙනහිරට : TOPO P. P. 25හි ලොට් අංක 1068 ද, දකුණට : TOPO P. P. 25හි ලොට් අංක 1067 සහ බස්නාහිරට : TOPO P. P. 25හි ලොට් අංක 1067 සහ 1049 ද මායිම්ව අක්කර තුනයි රූඩ් එකයි පර්චස් තුනක (අ. 3, රූ. 1, පර්. 3) බිම් ප්‍රමාණයෙන් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, ගොඩනැගිලි සහ සියළු දේ ද වේ. මෙය පොළොන්නරුව දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 1/3/245හි ලියාපදිංචි කර ඇත.

#### දෙවැනි උපලේඛනය

ඉහත පළමු උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම හා පරිශ්‍රය ද මෙම සියලු යන්ත්‍රාගාර හා යන්ත්‍ර සූත්‍ර ඒවා සවිකළ උපාංග ද පහත සඳහන් දේවලින් සමන්විත වේ :

| | | |
|---|---|---|
| 1. | අ. බ. 3.5ක මෝටරයක් සහ ස්ටාටරයක් සහිත හලර් | 01 |
| 2. | අ. බ. 3.5ක මෝටරයක් සහ ස්ටාටරයක් සහිත ස්ටෝනර් | 01 |
| 3. | අ. බ. 30ක මෝටරයක් සහිත හලර් | 01 |
| 4. | අ. බ. 30ක මෝටරයක් සහිත පොලිෂර් | 01 |
| 5. | අ. බ. 30ක මෝටරයක් සහ ස්ටාටරයක් සහිත සෙපරේටර් | 01 |
| 6. | අ. බ. 3ක මෝටරයක් සහිත පංකා | 01 |
| 7. | අ. බ. 3ක මෝටරයක් සහිත සිෆ්ටර් (දේශීය නිෂ්පාදනයකි) | 01 |
| 8. | බොයිලේරු | 01 |
| 9. | අ. බ. 1.5ක මෝටරයක් සහිත විදුලි සෝපාන | 01 |
| 10. | මෝටරය සහිත විදුලි සෝපාන | 01 |
| 11. | අ. බ. 3.5ක මෝටරයකින් සමන්විත ඩස්ට් පංකාව සහිත සිෆ්ටර් | 01 |

මේ සමග පළමු උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම හා පරිශ්‍රයන්ට සවිකර ඇති සෑම සහ කුමන හෝ ආකාරයේ අනෙකුත් සියලු දේ ද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩී. එම්. ඩී. ආර්. සී. එස්. ජයවර්ධන මහතා,
කළමනාකරු.

ලංකා බැංකුව,
බකමූණ ශාඛාව.

06-76

---

පීවී 61518.

### 2007 අංක 07 දරන සමාගම් පනත

### 394(3) වගන්තිය යටතේ "කළම්බු සවුත් ෂිප්යාඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.09.25 දින සංස්ථාපිත සමාගමක් වන කළම්බු සවුත් ෂිප්යාඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්

ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, කළම්බු සවුත් ෂිප්යාඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010ක් වූ මැයි මස 03 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

06-13

---

**සම්පත් බැංකුව - පී. එල්. සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ටී. ඩී. ඩිස්ට්‍රිබියුටර්ස් - ගිණුම් අංක 0035 1000 5359 සහ 0035 1000 5499

2008 ජූලි 24 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ගාල්ල ඉහල ඩික්සන් පාරේ අංක 16හි පදිංචි එකී ජනරජයේ ගාල්ල ඉහල ඩික්සන් පාරේ අංක 16 දරන ස්ථානයේ ටී. ඩී. ඩිස්ට්‍රිබියුටර්ස් යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ එකම අයිතිකරු වශයෙන් ව්‍යාපාරික කටයුතු කරගෙන යන ට්‍රෙවෝ ඩේවි සෙනෙවිරත්න යන අය බන්ධනදායි වශයෙන් මාතර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. පරණමාන විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2007 මාර්තු 22 වැනි දින හා අංක 952 දරන උකස් බැඳුම්කරය මගින් උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2008 මාර්තු මස 04 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් විසිනව ලක්ෂ අනූහත් දහස් හයසිය තිස් අටකුත් ශත දෙකක (රු. 2,997,638.02 ක් පමණයි) මුදලක් එකී බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් විසිනව ලක්ෂ අනූහත් දහස් හයසිය තිස් අටකුත් ශත දෙකක (රු. 29,97,638.02ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් විසිනව ලක්ෂ අනූහයදහස් හයසිය තිස් අටකුත් ශත දෙකක (රු. 29,96,638.02ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට විස්ස (20%) බැගින් 2008 මාර්තු මස 05 වැනි දින සිට එකී අංක 952 දරන බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතුව හිඟව ඇති මුදල ගෙවා පියවා නිමා කරන දින තෙක් තව දුරටත් පොළිය ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 952 බැඳුම්කරය මගින් එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් සීමාසහිත සම්පත් බැංකුව නමට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩන්ස්ටන් කෙලාට් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

උපලේඛනය

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, ගාල්ල මහනගර සභා සීමාව තුළ හා කඩවත් සතර තුළ දන්ගෙදර පිහිටි ඉහල ඩික්සන් පාරේ වරිපනම් අංක 16 දරන "පොකුණබොඩවත්ත නොහොත් පොකුණ වලව්වේ ලොට් 2" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු වී. නාගහවත්ත විසින් සාදන ලද 1994 මාර්තු 31 වැනි දාතම හා අංක 814 දරන පිඹුරේ ලොට් 2 ඒ ලෙස ලකුණු කොට නිරූපිත ගාල්ල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍ඉරුව ඒ 558/244 හි ලියාපදිංචි කර ඇති එකී අංක 814 පිඹුරට අනුව උතුරටඃ ලොට් 3 ද, නැගෙනහිරට : ඉහළ ඩික්සන් පාරේ, වරිපනම් අංක 20/1 දරන උලුගෙදරවත්ත සහ කුඹල්ගේ වත්ත සහ ඉහළ ඩික්සන් පාරේ වරිපනම් අංක 14/1 දරන ඔරොප්පු වත්ත ද, දකුණට : එම ඉඩමේම ලොට් 2හි ලොට් 2 සී සහ ලොට් 2 බී ද සහ බටහිරට : ඉහල ඩික්සන් පාර ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් තිස්තුනයි දශම දෙකයි පහයි බිංදුවක් (අක්. 0, රූඩ්. 0, පර්. 33.250) වන බෙදා වෙන් කොට වන බෙදා වෙන් වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ ඉඩම එහි පස, ගහකොල, වගාවන් සහ අනෙකුත් සියළුම දේ සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

06-113/3

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධන කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභාව තුළ, හෝමාගම, ගලවිලවත්ත, සුනේත්‍රා මාවතේ, වරිපනම් අංක 9 දරන ගොඩනැගිල්ල, ගහකොළ, වැවිලි සහ එහි ඇති වෙනත් සියල්ල ඇතුළත් වූ ගලවිල එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් සාදන ලද 1964 ජනවාරි මස 07 දිනැති අංක 2858 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 46 උකස් දේපළ එනම්, එකී ලොට් 46, උතුරට : ලොට් 53 ද , නැගෙනහිරට : ලොට් බී (පාරට වෙන් කළ කොටස සඳහා) ද, දකුණට : ලොට් 41 ද, බස්නාහිරට : ලොට් 45 ද මායිම්ව එකී අංක 2858 දරන පිඹුර ප්‍රකාර පර්චස් විස්සක (අ. 0. රූ. 0, පර් 20) වඩා නිවැරිදිව පර්චස් දහනවයයි දශම හයක (අ. 0, රූ. 0, පර්. 19.6) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ ජී 785/271 හි ලියාපදිංචි කර ඇත.

2010.03.18 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

## යෝජනා සම්මතය

1. මහජන නොතාරිස් බන්දුමතී බෝධිනායක රණසිංහ විසින් සහතික කරන ලද 1994.12.27 දිනැති අංක 2561 දරන බැඳුම්කරය, මත මුල් මුදල හා අයිරා ගිණුම මත 2010.02.08 දින තෙක් පොළිය වශයෙන් රුපියල් විසිලක්ෂ හැත්තෑහය දහස් පන්සිය හැත්තෑදෙකයි ශත විසිහතරක (රු. 20,76,572.24) මුදලක් සහ රුපියල් ලක්ෂ පහක් (රු. 5,00,000) මත වසරකට සියයට පහළොව (15%) බැගින් පොළියක් ද, 2010.02.09 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් ලොරෙන්සු පටබැඳිගේ දයානන්ද ගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 2561 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් විසිලක්ෂ හැත්තෑහය දහස් පන්සිය හැත්තෑදෙකයි ශත විසිහතරක (රු. 20,76,572.24) මුදල සමග 2010.02.09 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතුව පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් වෙන්දේසිකාර මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකුව ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම් පළ කිරීමට ලංකා බැංකුවේ, සම්බන්ධතා කළමනාකරුට ද (අයකර ගැනීම් - ආයතනික) මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභාව තුළ, හෝමාගම, ගලවිලවත්ත, සුනේත්‍රා මාවතේ, වරිපනම් අංක 9 දරන ගොඩනැගිල්ල, ගහකොළ, වැවිලි සහ එහි ඇති වෙනත් සියල්ල ඇතුළත් වූ ගලවිල එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් සාදන ලද 1964 ජනවාරි මස 07 දිනැති අංක 2858 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 46 උකස් දේපළ එනම්, එකී ලොට් 46, උතුරට : ලොට් 53 ද , නැගෙනහිරට : ලොට් බී (පාරට වෙන් කළ කොටස සඳහා) ද, දකුණට : ලොට් 41 ද, බස්නාහිරට : ලොට් 45 ද මායිම්ව එකී අංක 2858 දරන පිඹුර ප්‍රකාර පර්චස් විස්සක (අ. 0. රූ. 0, පර් 20) වඩා නිවැරිදිව පර්චස් දහනවයයි දශම හයක (අ. 0, රූ. 0, පර්. 19.6) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 785/271 හි ලියාපදිංචි කර ඇත.

මහජන නොතාරිස් බී. බී. රණසිංහ විසින් සහතික කරන ලද 1994.12.27 වැනි දිනැති අංක 2561 දරන උකස් බැඳුම්කරය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එම්. තිලකරත්නබණ්ඩා,
සම්බන්ධතා කළමනාකරු,
(අයකර ගැනීම් - ආයතනික).

ලංකා බැංකුව,
අයකර ගැනීමේ ඒකකය,
අංක 4, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

06-77

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - කඩුවෙල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

එස් ඇන්ඩ් ඒ මාර්කටින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ දෙණියගෙදරගේ සුදත් සිරිසේන.

2010.03.31 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් දෙණියගෙදරගේ සුදත් සිරිසේන සපයන ලද ණය මුදල් ආපසු ගෙවන බවට සුරකුමක් වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. සී. පී. වෙත්තසිංහ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 2006.03.29 වැනි දින සහ අංක 2641 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු රුපියල් හතලිස්තුන්ලක්ෂ අසූඑක්දහස් අටසිය පනස් පහයි ශත විසිපහ (රු. 43,81,855.25)ක මුදලක් ගෙවීම උකස්කරු හැටියට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස්කර ඇති හෙයින්,

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් දෙණියගෙදරගේ සුදත් සිරිසේන සපයන ලද ණය මුදල් ආපසු ගෙවන බවට සුරකුමක් වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. සී. පී. වෙත්තසිංහ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 2006.11.08 සහ 2007.04.20 වැනි දිනැති සහ පිළිවෙලින් අංක 2752 සහ 2812 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දෙණියගෙදරගේ සුදත් සිරිසේන උකස්කරු හැටියට සහ එස්. ඇන්ඩ් ඒ මාර්කටින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස්කර ඇති හෙයින්,

තවද එකී දෙණියගෙදරගේ සුදත් සිරිසේන යන අය ඉහත කී එස් ඇන්ඩ් ඒ මාර්කටින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂවරයකු වශයෙන් එම සමාගමේ පාලනය හා කළමණාකරණය දරන අතර, ඒ අනුව එකී දෙණියගෙදර සුදත් සිරිසේන යන අය ඉහත කී එස් ඇන්ඩ් ඒ මාර්කටින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අත්‍ය අයිතිකරු හා පාලනය දරන තැනැත්තා වන අතර, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් එස් ඇන්ඩ් ඒ. මාර්කටින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට සැපයූ මූල්‍ය පිළිසරණයන්හි නියම අර්ථලාභියා එකී දෙණියගෙදරගේ සුදත් සිරිසේන යන අය වන හෙයින් ද,

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු මුදල් ආපසු ගෙවීම එකී එස් ඇන්ඩ් ඒ. මාර්කටින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ දෙණියගෙදරගේ සුදත් සිරිසේන යන අයවළුන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් පනස් පන් ලක්ෂ අනූහත්දහස් හාරසිය හතලිස් එකයි ශත පනස්හත (රු. 55,97,441.57) ක මුදලක් 2010.03.01 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 55,97,441.57ක මුදලට 2010.03.02 වැනි දින විට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවනල ද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2641, 2752 සහ 2812 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ

වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, අදිකාරි පත්තුවේ, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාවේ, මුල්ලේරියාව උප කාර්යාලය සීමාවේ කොළඹ පාරේ, වරිපනම් අංක 583හි ''ගොඩකදුරුගහකුඹුර'' නමැති ඉඩමට බලයලත් මානක බී. රණතුංග විසින් ලියා සහතික කරන ලද 2003.07.03 වැනි දිනැති අංක 04/2003 පිඹුරේ ලොට් අංක ඒ නමැති ඉඩමට මායිම්, උතුරට : ප්‍රධාන පාරෙන් ද, නැගෙනහිරට : එන්. ජී. පී. පෙරේරාට සහ තවත් අයට අයිති ඉඩමෙන් ද, දකුණට : පිඹුරු අංක 538හි ලොට් අංක බී9 න් ද සහ බස්නාහිරට : එන්. ඩී. ෆ්‍රැන්සිස්ට අයිති ඉඩමෙන් ද මයිම් වූ රූඩ් එකයි පර්චස් තිස්හතයි දශම හතයි පහ (අ. 0, රූ. 1, පර්. 37.75)ක් විශාල ඉඩම ගොඩනැගිලි සහ සියළු දේත් සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

06-117/4

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

**(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡෙදය ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡෙදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡෙදය ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡෙද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

*(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)*

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | පිටපතක මිළ රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡෙදය ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡෙදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡෙදය ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡෙද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති *උපලේඛනයේ* දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2010** | | | |
| ජුනි | 2010.06.04 | සිකුරාදා | 2010.05.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.06.11 | සිකුරාදා | 2010.05.26 | බදාදා | දහවල් | 12.00 |
| | 2010.06.18 | සිකුරාදා | 2010.06.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.06.24 | බ්‍රහස්පතින්දා | 2010.06.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2010.07.02 | සිකුරාදා | 2010.06.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.07.09 | සිකුරාදා | 2010.06.24 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2010.07.16 | සිකුරාදා | 2010.07.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.07.23 | සිකුරාදා | 2010.07.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.07.30 | සිකුරාදා | 2010.07.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2010.08.06 | සිකුරාදා | 2010.07.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.08.13 | සිකුරාදා | 2010.07.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.08.20 | සිකුරාදා | 2010.08.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.08.27 | සිකුරාදා | 2010.08.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.